1441

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level) Grade 12 Third Term Test 2018 July**

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
Communication & Media Education I

29 S I

කාලය: පැය දෙකයි
Two hours

විභාග අංකය: ...........................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදන්න.

(01) සන්නිවේදනය පිළිබඳ ඇති වඩාත් සාධනීය ප්‍රකාශය තෝරන්න.
(1) මානවයා සන්නිවේදනයේ යෙදෙන්නේ අවශ්‍යතාවලට පමණි.
(2) සන්නිවේදනය සඳහා පංචේන්ද්‍රිය පමණක් අවශ්‍ය නොවේ.
(3) සන්නිවේදනය තුළ ඇත්තේ තොරතුරු හුවමාරුව පමණි.
(4) මානව සමාජයේ පැවැත්මට සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.
(5) සන්නිවේදනය ඒකමාර්ගිකව ගමන් කරයි.

(02) "භාෂාව, කාලය හා අවකාශය අතික්‍රමණය කොට ඇත. මාධ්‍ය, භාෂාව අතික්‍රමණය කොට තිබේ. මාධ්‍යම සංදේශය වේ" මෙම ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන්ද?
(1) විල්බර් ශ්‍රාම් (2) මාෂල් මැක්ලුහන් (3) එඩ්වඩ් සැපීර්
(4) ඩේවිඩ් කේ. බර්ලෝ (5) හැරල්ඩ් ලැස්වෙල්

(03) නිදහස්වාදී සන්නිවේදන පසුබිමේ සිටි මහා පුරුෂයන් සිව්දෙනෙකි. ඔවුන් අතරට අයත් නොවන්නේ කවුරුන් ද?
(1) ජෝන් මිල්ටන් (2) ජෝන් අර්ස්කින් (3) තෝමස් ජෙෆර්සන්
(4) වී. අයි. ලෙනින් (5) ජෝන් ස්ටුවර්ට් මිල්

(04) පුවත්පත් නිදහස පිළිබඳව ධනවාදීන් ප්‍රකාශ කරන්නේ රජය විසින් වාරණය ඉවත් කළ පසු සියලු ම පක්ෂවලට නිදහසේ පුවත්පත්වල සිය ප්‍රවෘත්ති පළ කරගත හැකි බවයි. මෙහි දී සිදුවන්නේ. නිදහසේ නාමයෙන් පොදු ජනතාව මුළා කිරීම, රැවටීම, අයුතු ලෙස බලපෑම් කිරීම හා සූරා කෑමයි.
මෙම ප්‍රකාශය අඩංගු වන්නේ,
(1) සෝවියට් කොමියුනිස්ට් සංකල්පය තුළ (2) නිදහස් මතවාදී සංකල්ප තුළ
(3) සංවර්ධන සංකල්පය තුළ (4) අධිපතිවාදී සංකල්පය තුළ
(5) සමාජ වගකීම් සංකල්පය තුළ

(05) "සමාජය යනු අනිකක් නොව සන්නිවේදනය හේතුකොට ගෙන සන්නිවේදනය තුළින් ගොඩ නැගෙන සබඳතා ජාලයයි." මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් ද?
(1) ෂැනෝන් වීවර් ය. (2) විල්බර් ශ්‍රාම් ය. (3) හැරල්ඩ් ලැස්වෙල් ය.
(4) එඩ්වඩ් සැපීර් ය. (5) චාල්ස් කූලි ය.

(06) සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ අවම වැදගත් කමක් ඇති ප්‍රකාශය තෝරන්න.
(1) සන්නිවේදනය ස්වාභාවික ක්‍රියාවලියකි.
(2) සන්නිවේදනය ඒකමාර්ගිකව පමණක් සිදු වේ.
(3) විවිධ බාධක නිසා සන්නිවේදනය ක්‍රියාවලිය අසාර්ථක විය හැකිය.
(4) වාරණ ක්‍රියාවලියේ දී දොරටුපාලක යනුවෙන් සංකල්පයක් ඇත.
(5) සන්නිවේදනය අවස්ථානුකූල ක්‍රියාවලියකි.

(07) සන්නිවේදන මූලිකාංග වලට අයත් නොවන්නේ කුමක් ද?
(1) මූලාශ්‍රය (2) සංදේශය (3) ග්‍රාහකයා
(4) අත්දැකීම් පසුතලය (5) වාරණය

(08) සන්නිවේදය මානව ශිෂ්ටාචාරය තුළ විශිෂ්ට කාර්යයන් ඉටු කරයි. සන්නිවේදනයේ මූලික කාර්යයන්ට අයත් නොවන්නේ කුමක් ද?

(1) අධ්‍යාපනය (2) තොරතුරු සම්පාදනය (3) දේශපාලනය
(4) සංස්කෘතික කාර්ය (5) පෙළඹවීම

(09) තොරතුරු ආකේතකරණය ලක් කිරීම සන්නිවේදනය ක්‍රියාවලියේ දී අත්‍යවශ්‍ය වේ. මෙය පළමු වරට පෙන්වා දෙන ලද්දේ,

(1) එඩ්වඩ් සැපීර් ය. (2) හැරල්ඩ් ලැස්වෙල් ය. (3) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ය.
(4) විල්බර් ශ්‍රාම් ය. (5) ඩේවිඩ් කේ බර්ලෝ ය.

(10) වඩාත් නිවැරදි ප්‍රකාශය අන්තර්ගත වරණය තෝරන්න.

(1) පුරවැසි මාධ්‍ය වාර්තාකරණය සන්නිවේදන තාක්ෂණය මත රඳා පවතී.
(2) තථ්‍ය සන්නිවේදන තාක්ෂණය සැමවිටම භාවිත තාක්ෂණය අභිබවා සිටී.
(3) ගෝලීකරණය සමග සියලු ජනමාධ්‍ය සංඛ්‍යාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි.
(4) දොරටුපාල ක්‍රියාවලිය තුළ ජනමාධ්‍ය අතර තරඟය පාලනය කිරීමක් සිදු වේ.
(5) ලිඛිත සන්නිවේදනය තුළ කථන සන්නිවේදන විධි ඇතුළත්ව තිබිය හැකිය.

(11) සන්නිවේදයෙහි යෙදෙන පුද්ගලයන් අතර සමාජ පසුබිම, අත්දැකීම් පසුතලය සම තත්ත්වයක පවතී නම් එකී කාර්ය වඩාත් පහසු වේ. මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ කවුරුන් ද?

(1) ඩේවිඩ් කේ බර්ලෝ (2) හැරල්ඩ් ලැස්වෙල් (3) විල්බර්ශ්‍රාම්
(4) ඩැනියල් ලර්නර් (5) ඩේවිඩ් සැපීර්

(12) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී තොරතුරු විසරණය සඳහා යොදාගත හැක්කේ

(1) ගුවන් විදුලිය, ජංගම දුරකථන, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපැල යි.
(2) ස්ථාවර දුරකථන, ජංගම දුරකථන, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපැල යි.
(3) ස්ථාවර දුරකථන, ජංගම දුරකථන, විද්‍යුත් තැපැල, රූපවාහිනිය යි.
(4) පුවත්පත්, ගුවන්විදුලිය, ජංගම දුරකථන, විද්‍යුත් තැපැල යි.
(5) විද්‍යුත් තැපැල, ෆේස් බුක්, ජංගම දුරකථන, රූපවාහිනිය යි.

(13) පණිවිඩයක ස්වභාවය මූලික කොටස් තුනක් යටතේ විග්‍රහ වේ. එය නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

(1) අන්තර්ගතය, ආකෘතිය, සංදර්භය
(2) අන්තර්ගතය, සංකේතය, ආකාර්ශනය
(3) මූලධාතුව, කේත, අන්තර්ගතය
(4) අන්තර්ගතය, සංදර්භය, ආකර්ශනය
(5) ආකෘතිය, සැකැස්ම, ආකර්ශනය

● අංක 14 සිට 18 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | මූලාශ්‍රය/සන්නිවේදක | B | සංදේශය | C | මාධ්‍ය / නාළිකාව |
| D | සම්ප්‍රේෂණාගාරය | E | ග්‍රාහකයා/ විකේතකරු | F | බාධා |
| G | ප්‍රතිචාර/ ප්‍රතිපෝෂණ | H | බලපෑම | I | අග්‍රස්ථය |
| J | අර්ථකථනය | K | අත්දැකීම් ක්ෂේත්‍රය | L | සංඥා |

(14) ඉහත සඳහන් අංක අතරෙන් හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතියට ඇතුළත් වන්නේ,

(1) A B C D E (2) A B C E I (3) A L D F H
(4) A B C E H (5) A B C E F

(15) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට අයත් අංග පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A B C E (2) A B E G (3) A B C J
(4) A B D E (5) A B E J

(16) ඉහත දක්වා ඇති අංග අතරෙන් A හා E අතර අවබෝධයක් ගොඩ නැගීමට L අපොහොසත් වන්නේ නම් එය හඳුන්වන්නේ කුමක් ලෙස ද?

(1) A (2) B (3) H (4) F (5) I

(17) ඩේවිඩ් කේ බර්ලෝගේ සන්නිවේදන ආකෘතියට අයත් වන අංග ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C H (2) A D F G (3) A B C E
(4) A B C L (5) A D F G

(18) සන්නිවේදනය, සන්නිවේදක ග්‍රාහක හුවමාරු ක්‍රියාවලියක් වීමට අවශ්‍ය අංග මොනවා ද?

(1) A B E J G (2) A B C F J (3) A B C F G
(4) A L E G H (5) A B D E G

(19) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ දී තොරතුරු රැස් කිරීම මතකය හා මතක් කිරීම මූලික නිපුණතාවයකි. ඊට අදාළ නොවන්නේ කුමක් ද?

(1) ආවර්ජනය (2) කටපාඩම (3) සිහින දැකීම
(4) හෘද සාක්ෂිය (5) සංජානය

(20) මාධ්‍ය නියාමනයට අදාළව යොදාගත හැකි ක්‍රමවේද කීපයක් පන්ති කාමරයේ දී සාකච්ඡා විය.

A - ආචාරධර්ම පවත්වාගෙන යාම.
B - නීති රීති පැනවීම. (නෛතික රාමුව)
C - සම්ප්‍රදායක් ගොඩ නැගීම.
D - උද්ඝෝෂණ සිදු කිරීම.
E - මාධ්‍ය සම්මුති ඇති කරලීම

මේ අතරින් නියාමනය වඩාත් කාර්යක්ෂමව සිදු කළ හැකි වන්නේ

(1) A මගිනි (2) B මගිනි (3) C මගිනි
(4) D මගිනි (5) E මගිනි

(21) ප්‍රදේශයේ පවතින කාලගුණික තත්ත්වය පිළිබඳ ගුවන් විදුලියෙන් ඇසුණු ප්‍රවෘත්තියක් කමල් අමල්ට දන්විය. අමල් ඒ පිළිබඳව කල්පනා කොට ගමේ විහාරයට ගැමියන් කැඳවා උපදෙස් දුන්නේ ය. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන ප්‍රභේදවල අනුපිළිවෙළ කුමක් ද?

(1) ශ්‍රව්‍ය, වාචික, පුද්ගලාන්තර, සමූහ සන්නිවේදනය
(2) අන්තර්වර්ති, පුද්ගලාන්තර, සමූහ, ජන සන්නිවේදනය
(3) පුද්ගලාන්තර, අන්තර්වර්ති, සමූහ සන්නිවේදය
(4) වාචික, ජන, සමූහ, දෘශ්‍ය, සන්නිවේදනය
(5) ජන, පුද්ගලාන්තර, අන්තර්වර්ති, සමූහ සන්නිවේදනය

(22) ඥාන ගවේෂණය මිනිසා විසින් ලෝකය අනාවරණය කර ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයකි. ඥාන ගවේෂණයේ කාර්යයන් පමණක් ඇතුළත් වන්නේ කුමන වරණය තුළ ද?

(1) නිරීක්ෂණ, සන්නිවේදනය, සංස්ලේෂණය, නියාමනය
(2) නියාමනය, නියෝජනය, විශ්ලේෂණය, සංකල්ප
(3) සංජානනය, විනිශ්චය, සම්පරීක්ෂාව, තර්කය
(4) තර්කය, සංජානනය, සංකල්ප, නිරීක්ෂණ
(5) සන්නිවේදනය, සංජානනය, නියෝජනය, සංකල්ප

(23) සමාජානුයෝජනය පිළිබඳ අඩු වැදගත්කමක් ඇති ප්‍රකාශයක් ඇති වරණය තෝරන්න.

(1) පුද්ගලයාගේ අවශ්‍යතා සපුරා ගැනීමට සමාජානුයෝජනය අවශ්‍ය වේ.
(2) සමාජය යහපත් යැයි සම්මත කරගත් ආකාරයට හැසිරීමට සමාජානුයෝජනය අවශ්‍ය වේ.
(3) අනුකරණයේ දී පරමාදර්ශී චරිතවල ගති පැවතුම් ආරෝපණය කර ගනී.
(4) ජනමාධ්‍යයේ සමාජානුයෝජනය වගකීමෙන් ක්‍රියාකරයි.
(5) සම්ප්‍රදායික සන්නිවේදන ප්‍රවේශ ද සමාජානුයෝජනයේ දී වැදගත් වේ.

(24) ගෝලීයකරණයේ නව ප්‍රවණතාවක් අන්තර්ගත නොවන්නේ කුමන ප්‍රකාශය තුළ ද?

(1) ජන සන්නිවේදන ක්‍රියාවලියේ විවිධ සංඝටක නිර්මාණය වේ.
(2) ජනමාධ්‍යන්ට අතිරේකව ආත්ම කේන්ද්‍රීය මාධ්‍ය ද බිහි වේ.
(3) ජාතික රාජ්‍යන්ගේ සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා වේ.
(4) බහුජන තොරතුරු අවකාශ වාණිජකරණයට ලක් වේ.
(5) නව සංස්කෘතික ස්වරූප තුළ විචිත්‍ර සංස්කෘතියක් ගොඩ නැගේ.

(25) පුරවැසි මාධ්‍යයට අදාළ වඩාත් වැදගත් ප්‍රකාශය තෝරන්න.

(1) පුරවැසි මාධ්‍ය දියුණු තාක්ෂණය යොදා ගනී.
(2) පුරවැසි මාධ්‍යකරුවා වෘත්තීය මාධ්‍යකරණයේ යෙදේ.
(3) දැඩි ඒකාධිපති සමාජ තුළ පුරවැසි මාධ්‍ය ක්‍රියාත්මක වේ.
(4) පුරවැසි මාධ්‍ය තුළින් පුරවැසි ජීවිතයේ ගුණාත්මක බව පෝෂණය වේ.
(5) පුරවැසි මාධ්‍යකරුවා මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ මනා දැනුමකින් ක්‍රියා කරයි.

(26) විකල්ප හා විරෝධාකල්ප මාධ්‍යට ඇතුළත් නොවන ප්‍රකාශයක් තෝරන්න.

(1) දැඩි ඒකාධිපති පාලන ක්‍රමයක් තුළ විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය ක්‍රියාත්මක වේ.
(2) විකල්ප මාධ්‍යකරුවෝ සැමවිටම පාලක පක්ෂය සමඟ කටයුතු කරති.
(3) මාධ්‍ය ක්‍රියාවලිය ලාභය අරමුණු කොට නොව සමාජ විඥානය පුළුල් කිරීමට යොදා ගනී.
(4) ග්‍රාහක කණ්ඩායම කුමක් වුවත් එහි බලපෑම පුළුල් වේ.
(5) පාරිභෝගික වාදයට හා ජනප්‍රිය සංස්කෘතියකට එරෙහි ව ගොඩ නැගේ.

(27) ස්ව සංකල්ප පෝෂණයට අදාළ **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) ස්ව සංකල්ප යනු තමා කෙබඳු කෙනෙක්දැයි තේරුම් ගෙන ඇති ආකාරයයි.
(2) ස්ව සංකල්පය සාපේක්ෂ වශයෙන් ස්ථිරසාර වූ සංජනනයකි.
(3) ස්ව සංකල්පය යනු පුද්ගලයා පෙර ආත්මයේ සිට ගෙන එනු ලබන්නකි.
(4) ස්ව සංකල්පය පෝෂණයට තමා ජීවත්වන පරිසරය උපකාරී වේ.
(5) ස්ව සංකල්පය යනු පුද්ගලයා විසින් තමා සංජනනය කරගෙන ඇති ආකාරයයි.

(28) පුද්ගලාන්තර සන්නිවේදන කුසලතා හා නිපුණතා සන්නිවේදන ක්‍රියාවලියේ දී අත්‍යවශ්‍ය වේ.
A - ඉගෙනීම B - ඵලදායී කථනය
C - ආචාරශීලීත්වය D - සහානුභූතිය
E - සම්මුඛ සාකච්ඡා F - ශ්‍රවණ නිපුණතාව
මේ අතරින් පුද්ගලාන්තර සන්නිවේදන නිපුණතාවලට අයත් නොවන්නේ කුමක් ද?
(1) AE (2) BD (3) CE
(4) EF (5) AF

(29) ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණයක් නොවන්නේ කුමක් ද?
(1) බහු මාධ්‍ය යන්ත්‍රය (2) උඩිස් යන්ත්‍රය (OHP) (3) ස්ලයිඩ් යන්ත්‍රය
(4) චුම්භක පුවරුව (5) ක්ෂණික යන්ත්‍රය

(30) භාෂාව බිහිවීම මානව ශිෂ්ටාචාරයේ විශිෂ්ට සිද්ධියකි. එතෙක් සංකේත, සංඥා හා ශබ්ද මගින් අදහස් හුවමාරු කරගත් මානවයා වඩාත් පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගැනීමට මෙමගින් හැකි විය. පහත ප්‍රකාශ අනුපිළිවෙළින් අන්තර්ගත වන්නේ කුමන වරණය තුළ ද?
A - භාෂාවේ පද හා ශබ්ද අතර සෘජු සම්බන්ධතාවක් නොමැත.
B - භාෂාව මගින් අතීත, වර්තමාන, අනාගත තොරතුරු ඉදිරිපත් කළ හැකිය.
C - භාෂාව මගින් අලුත් අලුත් අදහස් ඉදිරිපත් කළ හැකිය.
D - භාෂාව මගින් විස්තරාත්මකව අදහස් ඉදිරිපත් කළ හැකිය.
(1) දුරස්ථාපානය, ද්විත්ව භාවය, නිර්මාණාත්මක භාවය, අවිහිත භාවය
(2) ද්විත්ව භාවය, අවිහිත භාවය, නිර්මාණාත්මක භාවය, ප්‍රත්‍යාවර්ථනය
(3) නිර්මාණාත්මක භාවය, රූඪ කෘත භාවය, ප්‍රත්‍යාවර්තනය, අවිහිත භාවය
(4) අවිහිත භාවය, ද්විත්ව භාවය, දුරස්ථාපනය, නිර්මාණාත්මක භාවය
(5) ද්විත්ව භාවය, දුරස්ථාපනය, නිර්මාණාත්මක භාවය, අවිහිත භාවය

(31) පහත ප්‍රකාශ අධ්‍යනය කරන්න. භාෂාවේ විවිධ කාර්යයන් හා ඒවා සම්බන්ධ වන ආකාරය දක්වන්න.
A - අනේ අපොයි, මේ මොන අපරාධයක් ද?
B - එඩිතර, අවංක, උගත්, බුද්ධිමත්, තරුණ දේශපාලඥයකු
C - ආ, කොහොමද? කොහේද මේ උදයේම යන්නේ.
D - කොහෙද අමනයෝ ගියේ, මෙහෙ වර තකතීරුවා
(1) හැඟීම් කීම, පෙළඹවීම, සුහදතාව පළ කිරීම, විනෝදය සැපයීම.
(2) පෙළඹවීම, හැඟීම් කීම, විනෝදය සැපයීම, බිය වැද්දීම
(3) හැඟීම් කීම, පෙළඹවීම, සුහදතාව පළ කිරීම, බිය වැද්දීම
(4) බිය වැද්දවීම, හැඟීම් කීම, සුහදතාව පළ කිරීම, පෙළඹවීම
(5) පෙළඹවීම, හැඟීම් කිම, සුහදතාව පළකිරීම, බිය වැද්දීම

(32) ජීව භාෂාව, මෘත භාෂාව හා සම්භාව්‍ය භාෂාව යනුවෙන් භාෂාවේ ප්‍රභේද තුනකි. ජීව භාෂා ගණයට අයත් නොවන භාෂා ඇති වරණය තෝරන්න.
(1) සිංහල, දෙමළ, ස්පාඤ්ඤ, චීන, ඉංග්‍රිසි
(2) හින්දි , ගුජරාටි, කණ්ණඩ, උර්දු, ප්‍රංශ
(3) අරාබි, ප්‍රංශ, ජර්මන්, ජපන්, තෙළිඟු
(4) පාලි, සංස්කෘත, ලතින්, හිබ්‍රෑ, සුමේරියන්
(5) ඉංග්‍රීසි, මැන්ඩරින්, දිවෙහි, දෙමළ , උර්දු

(33) වඩාත් නිවැරැදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
(1) කලින් කලට වෙනස්වන පොදු භාෂාව ජීව භාෂාවයි.
(2) භාෂාවේ සම්මතය යනු පොදු සමාජය පිළිගත් භාෂාවයි.
(3) උප භාෂා පැවැතීම සම්මත භාෂාවක ලක්ෂණයකි.
(4) අසම්මත භාෂා තුළ අන්‍ය ලක්ෂණ පවතී.
(5) අසම්මත භාෂාව භාවිත කිරීම ජනමාධ්‍යයේ ලක්ෂණයකි.

1438

(34) පහත සඳහන් උප භාෂා භාවිත වන ප්‍රදේශ තෝරන්න.

A - මුත්තා B - අතප්පා B - බුඩා

(1) උඩරට පළාත, සබරගමුව, දකුණ පළාත (2) දකුණු පළාත, රජරට පළාත, ඌව පළාත
(3) බස්නාහිර පළාත, රජරට පළාත, වයඹ පළාත (4) දකුණු පළාත, උඩරට පළාත, හත් කොරලේ
(5) රජරට පළාත, ඌව පළාත, සබරගමුව

(35) භාෂා භාවිත ප්‍රභේද කීපයක අර්ථ පහත දැක්වේ.

A - නියමිත සම්ප්‍රදායන්, රීති, යෙදුම් පැවතීම. B - රිද්මය, වේගය හා යෙදුම් ආදියේ විශේෂතා පැවතීම
C - පෞද්ගලික දෘෂ්ටියක් හා මතවාදයක් පැවැතිම. D - අණදීම්, ආයාචනා, ආත්ම ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(1) භාෂණය, රූපණය, කථනය, විවරණය (2) ලේඛනය, රූපණය, කථනය, භාෂාණය
(3) භාෂාණය, රූපණය, විවරණය, කථනය (4) ලේඛනය, කථනය, විවරණය, භාෂණය
(5) විවරණය, ලේඛනය, කථනය, රූපණය

(36) මහජන සම්බන්ධතාවට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

(1) මහජනයා යනු පොදු ජනයා නොවේ.
(2) සෑම ආයතනයකටම තෝරාගත් මහජන කණ්ඩායම් සිටී.
(3) සංවිධානයට අයත් මහජන කණ්ඩායම සංවිධානයෙන් පිටත ද සිටිය හැකිය.
(4) මහජන සම්බන්ධතාව අයත් වන්නේ වාණිජ ක්ෂේත්‍රයට පමණි.
(5) එක් සංවිධානයකට අයත් මහජන කණ්ඩායම තවත් සංවිධානයක සිටිය හැකිය.

(37) මහජන සම්බන්ධතා විධිවලට අයත් නොවන අංගයක් ඇති වරණය තෝරන්න.

(1) මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, ඡායාරූප (2) අනුග්‍රාහකත්වය, ප්‍රදර්ශන, මාධ්‍ය සම්බන්ධතා
(3) පාරිසරික මෙවලම්, අනුග්‍රාහකත්වය, චාරිකා (4) සංග්‍රහ, අනුග්‍රාහකත්වය, දායකත්වය
(5) පොදු දුරකථන, ශිථිලකරණවැඩසටහන්, මාධ්‍ය සම්බන්ධතා

(38) මහජන සම්බන්ධතා කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කළ හැක්කේ ඒ සඳහා ප්‍රමාණවත් නිපුණතා සංවර්ධනය කරගත් අයට ය. මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම නිපුණතාවයකි. මාධ්‍ය සාකච්ඡාවට අදාළ නිවැරදි පිළිවෙල තෝරන්න.

A - ප්‍රියජනක ස්ථානයක් සූදානම් කිරීම B - ආරාධනා පත්‍ර පිළියෙල කිරීම හා යැවීම
C - අරමුණක් ගොඩ නැංවීම D - අදහස් නිසි ලෙස ගොනු කිරීම
E - සාකච්ඡාවට සහභාගී වන්නන්ට හොඳින් සංග්‍රහ කිරීම F - පිළිගැනීමේ කවුළුවක් පැවැත්වීම
G - ප්‍රශ්න ඇසීමට අවස්ථාව දීම

(1) CDABFEG (2) CBAGFED (3) BCDAEGF
(4) CDAFEGB (5) CDAEBGF

(39) ආයතනයක අභ්‍යන්තර හා බාහිර මහජන සම්බන්ධතා පවතී. ඉන් අභ්‍යන්තර මහජන සම්බන්ධතාවලට පමණක් අයත් වන්නේ මොනවා ද?

(1) සුබ සාධක සමිති, චාරිකා, අනුග්‍රහකත්වය, ප්‍රදර්ශන පැවැත්වීම
(2) අනුග්‍රහකත්වය, ඡායාරූප, සංග්‍රහ, දිරි දීමනා දීම
(3) ශිථිලකරණ වැඩසටහන්, දිරි දීමනා, වැටුප් ගෙවීම්, නිළ ඇඳුම් ලබා දීම
(4) සුබ සාධක සමිති, චාරිකා, සංග්‍රහ, පහසුකම් සැලසීම
(5) සුබසාධක සමිති, චාරිකා, සංග්‍රහ, පහසුකම් සැලසීම.

(40) පහත සඳහන් වරණ තුළ අක්ෂර වින්‍යාශය නිවැරැදි පද පේළිය තෝරන්න.

(1) කණිෂ්ඨ, ඓතිහාසික, ඖෂධ, සීඝ්‍රගාමී
(2) ජ්‍යෂ්ඨ, ඉහළ, මහළු, ගිනි ගන්නා සුළු
(3) ශීඝ්‍රගාමී, පරිගණක, වාර්තාව, ත්‍රෛනිකාය
(4) ඖෂධ, මර්ධනය, වර්ධනය, සියළු
(5) වර්ථමානය, වාර්ථාව, සීඝ්‍රගාමී, මාහාචාර්‍ය්‍යය

(41) ශ්‍රවණය ප්‍රගුණ කළ යුතු ශක්‍යතාවයකි. ශ්‍රවණ ක්‍රියාවලියේ අනුපිළිවෙළ වන්නේ කුමක් ද?

(1) ඇසීම, තේරුම් ගැනීම, ඇගයීම, ප්‍රතික්‍රියා දැක්වීම
(2) ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම
(3) ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම, ඇගයීම
(4) තේරුම් ගැනීම, ඇසීම, ඇගයීම, ප්‍රතික්‍රියා දැක්වීම
(5) ඇසීම, ප්‍රතික්‍රියා දැක්වීම, තේරුම් ගැනීම, ඇගයීම

(42) "ස්ව සංකල්පය යනු පුද්ගලයකු ඔහු පිළිබඳව සත්‍ය ලෙස සලකනු ලබන වටිනාකම් වලින් යුක්ත වූ විශ්වාසයන්ගෙන් සකස් වූ සංකීර්ණ ක්‍රියාකාරී පද්ධතියක් " බව පැවසුයේ,

(1) පර්කි (2) රොජර්ස් (3) බර්න්
(4) බර්ලෝ (5) ඔස්ගුඩ්

(43) කිසියම් මාධ්‍ය ආයතනයක ජනමාධ්‍ය වේදියාගේ භූමිකාව ප්‍රධාන වශයෙන් තීරණය කරනුයේ,

(1) මාධ්‍යවේදියාගේ නිර්මාණශීලී හැකියාව මතය.
(2) මාධ්‍ය ආයතනයේ හිමිකරුවන්ගේ ප්‍රතිපත්තිය මතය.
(3) විද්වතුන්ගේ බලපෑම මතය.
(4) ග්‍රාහක කැමැත්ත මතය.
(5) මාධ්‍යවේදියාගේ දේශපාලන මතය අනුවය.

(44) මතකයේ ස්වභාවය අනුව පහත අවස්ථා සඳහා පවතින ප්‍රතිශතය වන්නේ,

A - ඇසූ දෙයින් B - තමන් කළ කී දෙයින්
C - කිය වූ දෙයින් D - ඇසූ දුටු දෙයින්

(1) A - 30% B - 50% C - 10% D - 40%
(2) A - 10% B - 30% C - 40% D - 20%
(3) A - 20% B - 80% C - 10% D - 50%
(4) A - 50% B - 20% C - 30% D - 40%
(5) A - 10% B - 80% C - 20% D - 50%

(45) ගුවන් විදුලි මාධ්‍ය සතු සුවිශේෂී ලක්ෂණය ලෙස දැක්විය හැක්කේ කුමක් ද?

(1) සාක්ෂරතාව නොමැති අයට භාවිත කරන මාධ්‍යක් වීම
(2) මිනිස් සිත ආකර්ශනය කරන මාධ්‍යක් වීම.
(3) සරල පැහැදිලි භාෂා රටාවකින් යුත් මාධ්‍යක් වීම
(4) වහා දැනෙන ඉක්මනින් සංවේදී වන භාෂාවකින් යුක්ත වීම
(5) ගෘහස්තව පරිහරණය කරන මාධ්‍යක් වීම

(46) නිර්වාචික සන්නිවේදනයට අදාළ ප්‍රකාශ කිපයක් ශිෂ්‍ය කණ්ඩායමක් විසින් ඉදිරිපත් කළහ. ඒ අතර සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

වරුන් - නිර්වාචික සන්නිවේදනය අඛණ්ඩ වේ.
කුසල් - නිර්වාචික සන්නිවේදනය සංස්කෘතිය මත පදනම් වේ.
ගනේෂ් - නිර්වාචික සන්නිවේදනයට මාර්ග සංඥා ඇතුළත් වේ.
එරංග - නිර්වාචික සන්නිවේදනයට පාර භාෂා ඇතුළත් නොවේ.

(1) වරුන් හා කුසල් (2) වරුන් හා ගනේෂ් (3) කුසල් හා ගනේෂ්
(4) ගනේෂ් හා එරංග (5) වරුන් හා එරංග

(47) මහජන සම්බන්ධතා වැඩපිළිවෙලක් සැලසුම් කිරීමේ දී ග්‍රාහකයන් හඳුනා ගැනීමට තොරතුරු හා දත්ත ලබාගත යුතු ක්‍රම නොගැළපෙන ක්‍රමය වන්නේ,

(1) සම්පරීක්ෂණ (2) නිරීක්ෂණ (3) සාකච්ඡා
(4) විශේෂඥ වාර්තා (5) සමීක්ෂණ

(48) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පළමු සිංහල පුවත්පත වූයේ කුමක් ද?

(1) සිංහල බෞද්ධයා (2) ලක්මිණි පහන (3) ලංකා ලෝකය
(4) සරසවි සඳරැස (5) ද කලම්බු ජර්නල්

(49) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට අදාළ වඩාත් ම නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) බහු පුද්ගල සහභාගිත්වයක් නොමැති වීම.
(2) නව තාක්ෂණය නිසා මෙහි ස්වරූපය වෙනස් වේ.
(3) ද්වි මාර්ගික සන්නිවේදනයක් සිදු වේ.
(4) සංජානනයන් අර්ථකථනය කර ගැනීමට උපකාරී නොවීම.
(5) සෑම විටම අරමුණු සහගතව ක්‍රියාත්මක වීම.

(50) ජන මාධ්‍යයේ ලක්ෂණ අතරට අයත් නොවන්නේ කුමක් ද?

(1) බහු පියවර ක්‍රමයක් පැවතිම.
(2) පණිවුඩය සෑම විටම පොදු වීම.
(3) දොරටු පාලකයින් ගණනාවක් සිටීම.
(4) සෑම විටම ජනමාධ්‍ය ඔස්සේ ව්‍යාප්ත වීම.
(5) පණිවුඩය පෞද්ගලික වීම.

1448

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 12 Third Term Test 2018 July

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
Communication & Media Education II

29 S II

කාලය: පැය තුනයි
Three hours

විභාග අංකය: ..............................................

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 20 කි.

(01) වර්තමානයේ දී සන්නිවේදන යනු හුදෙක් තොරතුරු හුවමාරු කරගැනීමෙන් ඉදිරියට ගොස් ඇති ක්‍රියාවලියක් මෙන් ම උපකරණයක් ද වේ.

(1) හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ නිර්වචනයේ අංග පහ නම් කරන්න.

(2) සන්නිවේදන ස්වභාව හතරක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(3) ෂැනොන් වීවර්ගේ ආකෘතිය ඇඳ එහි අංග හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(4) සන්නිවේදන සංකල්ප හතරක් නම් ඉන් දෙකක් වර්තමාන ජනමාධ්‍ය තුළ ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න.

(02) සන්නිවේදනය යනු ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය පහසුවෙන් අවබෝධ කර ගැනීමට ආකෘති, ප්‍රභේද, ස්වරූප ලෙස වර්ග කර ඇත.

(1) සන්නිවේදනය ව්‍යුහයට අදාළ මූලිකාංග තුන නම් කරන්න.

(2) සන්නිවේදන ප්‍රභේද වර්ගීකරණය වන ආකාරය දක්වා ඉන් ප්‍රභේද දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(3) සන්නිවේදන ස්වරූප තුනක් පාසලක ක්‍රියාත්මක වන අකාරය උදාහරණ මගින් විස්තර කරන්න.

(4) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක වන ආකාරය කරුණු හතරක් ඇසුරු කරගෙන රචනයක් ලියන්න.

(03) සමාජයේ ස්වභාවය තීරණය කිරීමෙහිලා මූලික කාර්යයක් ඉටු කරන්නේ නූතන දියුණු සන්නිවේදන ක්‍රම මගිනි. ඒ සඳහා සමාජයේ විකාශනය අධ්‍යයනය කෙරේ.

(1) ඥාන ගවේෂණයේ කාර්ය හතරක් දක්වන්න.

(2) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය උදාහරණ දෙකක් මගින් ඉදිරිපත් කරන්න.

(3) තොරතුරු සම්පාදන කාර්ය කරුණු තුනක් පදනම් කරගෙන විස්තර කරන්න.

(4) වර්තමාන සමාජයේ පුද්ගලයා සමාජානුයෝජනය කරවන ආයතන හතරක් විස්තර කරන්න.

(04) ගෝලීයකරණය සමාජයේ ඓතිහාසිකව සිදුවන සර්වාංගික ක්‍රියාවලියකි. ප්‍රවෘත්තිමය හා විනෝදාස්වාදනය වැඩ සටහන්වල අන්තර්ගතය ගෝලීය ලක්ෂ අත්පත් කරගෙන ඇති නිසා ග්‍රාහක රසඥතාව ගෝලීයකරණය වී සමාජයට බලපෑම් කරයි.

(1) ගෝලීකරණය සංකල්පය තුළ අන්තර්ගත ලක්ෂණ හතරක් නම් කරන්න.

(2) පුරවැසි මාධ්‍ය වර්තමාන සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය සඳහා උදාහරණ දෙකක් ඉදිරිපත් කරන්න.

(3) නව දිශාවකට සමාජය ගෙන යාම සඳහා විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය ක්‍රියාත්මක වන ආකාරය, එහි මූලික ලක්ෂණ තුනක් මගින් පැහැදිලි කරන්න.

(4) ගෝලීයකරණ හේතුවෙන් සංස්කෘතියට සිදුකරන බලපෑම පිළිබඳ රචනයක් ලියන්න.

(05) මහජන සම්බන්ධතාවය වර්තමාන සමාජයේ සෑම ආයතනයකම හා සංවිධානයකම ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපායි.

(1) මහජන සම්බන්ධතාවයේ අවශ්‍යතා දෙකක් නම් කරන්න.

(2) මහජන සම්බන්ධතා මෙවලම් දෙකක් ද විධි දෙකක් ද, නම් කර මෙවලමක් හා විධික්‍රමයක් වෙන වෙනම කෙටියෙන් පහදන්න.

(3) ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාව ක්‍රියාත්මක වන ආකාර තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(4) මහජන සම්බන්ධතා නිලධාරියකු ලෙස ඔබ ආයතනයක සේවය කරන්නේ නම් ඔබ සතු විය යුතු නිපුණතා හතරක් පිළිබඳ රචනයක් ලියන්න.

(06) මානව සන්නිවේනයට මෙන් ම ජනමාධ්‍ය ක්‍රියාවලියට භාෂාව අත්‍යවශ්‍ය වේ.

(1) මානව භාෂාවේ බිහිවීම පිළිබඳ මත හතරක් නම් කරන්න.

(2) භාෂා උපාර්ජනය සිදුවන ආකාරය කරුණු දෙකක් මගින් දක්වන්න.

(3) ජීව භාෂා ප්‍රවණතා තුනක් උදාහරණ සහිතව පහදන්න.

(4) පුවත්පත් මාධ්‍යයේ දී භාෂාව භාවිත කළ යුතු ආකාරය කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න.

(07) (1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන නිපුණතා හතරක් නම් කරන්න.

(2) සහානුභූතිය යනු කුමක් ද? ඒ සඳහා උදාහරණයක් සපයන්න.

(3) කෙටි සටහන් ලියන්න.

1. සමූහය හඳුනාගැනීම

2. විසම්මුතිය හා එකඟතාව

3. සමූහයේ ආචාරශීලීත්වය

(4) උපකරණාධාර සන්නිවේදනය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට වැදගත් වන ආකාරය යෝග්‍ය සාධක හතරක් ඇසුරු කරගෙන විස්තර කරන්න.

4178

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜீலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

දේශපාලන විද්‍යාව
**Political Science I**

**23 S I**

පැය දෙකයි
**02 hours**

උපදෙස්:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි

- **ප්‍රශ්න අංක 1 සිට 15 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

01. දේශපාලන විද්‍යාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,
A - දේශපාලන විද්‍යාව සමාජයීය විද්‍යාවකි
B - දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීය ලෙස හදාරන විෂයකි
C - රාජ්‍ය පාලනය පිළිබඳ හදාරන විෂයකි
D - ස්වාභාවික විද්‍යාවන් ලෙස හඳුන්වනු ලබයි
E - මිනිසාගේ දේශපාලන හැසිරීම් පිළිබඳව සලකා බලයි
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

02. දේශපාලන විද්‍යාව හා සම්බන්ධ විෂය කාණ්ඩය වන්නේ,
A - ඉතිහාසය
B - ආර්ථික විද්‍යාව
C - සමාජ විද්‍යාව
D - තර්ක ශාස්ත්‍රය
E - ආචාර විද්‍යාව
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

03. දේශපාලනය යනුවෙන් අදහස් වන්නේ,
A - දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ සියළුම මිනිසුන්ගේ සහභාගිත්වයෙන් කරන ක්‍රියාවකි.
B - දේශීය හා අන්තර් ජාතික වශයෙන් කරන බල අරගලයකි.
C - එකිනෙකට පරස්පර මතවාද පිළිබඳ මත ගැටුමකි.
D - එය ප්‍රායෝගික ක්‍රියාදාමයකි.
E - දේශපාලන සංකල්ප න්‍යාය පිළිබඳව අධ්‍යනය කරයි.
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

04. දේශපාලනය භාවිතා වන මාධ්‍යවලට අදාළ කාණ්ඩය
A - ප්‍රජාතන්ත්‍රවාදය
B - මැතිවරණ ක්‍රියාවලිය
C - ජනමාධ්‍ය
D - නිදහස් හා සාධාරණ මැතිවරණ
E - ජනතා පරමාධිපත්‍යය
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

05. ආණ්ඩුකරණ ක්‍රියාවලියට අන්තර් ගත වූ කාර්යයන් වන්නේ,
A - නීති සම්පාදනය
B - ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
C - රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය
D - නීති ක්‍රියාත්මක කිරීම
E - අන්තර් රාජ්‍ය සම්බන්ධතා
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

06. දේශපාලන ප්‍රතිපත්ති හැඩගස්වන ප්‍රධාන මතවාද කිහිපයකි.
A - මානව වාදය
B - සමාජ වාදය
C - ලිබරල් වාදය
D - සුභසාධන වාදය
E - ස්ත්‍රී වාදය
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

07. දේශපාලන චර්යාවට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
A - දේශපාලනයේ යෙදීම.
B - මැතිවරණයේ දී ඡන්දය පාවිච්චි කිරීම.
C - දේශපාලන ක්‍රියාවලියට සක්‍රියව සහභාගි වීම.
D - ආණ්ඩුකරණ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම.
E - එදිනෙදා දේශපාලන කටයුතු පිළිබඳව උනන්දු වීම.
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

08. දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ප්‍රවේශවලට අදාළ කාණ්ඩය වන්නේ,
A - මාක්ස්වාදී ප්‍රවේශය
B - දාර්ශනික ප්‍රවේශය
C - තුලනාත්මක ප්‍රවේශය
D - ස්ත්‍රීවාදී ප්‍රවේශය
E - දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

09. දාර්ශනික ප්‍රතිමානනීය ප්‍රවේශයේ ලක්ෂණවලට අදාළ වන්නේ,
A - දේශපාලන අධ්‍යාපනය සඳහා මූලිකව යොදාගත් දීර්ඝ කාලීන ප්‍රවේශයකි.
B - ප්‍රත්‍යක්ෂ මූලික සාධක පදනම් කරගෙන තීරණ ගනී.
C - ප්ලේටෝ හෝ ඇරිස්ටෝටල් එම ප්‍රවේශයේ පුරෝගාමීන්ය.
D - 20 වන සියවසේ චින්තකයන් ලෙස මහත්මා ගාන්ධි, ජෝන් පෝල්ස් වැනි අයයි.
E - සිතා ගැනීම් මත පදනම් වූ ප්‍රවේශයකි.
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

10. තුලනාත්මක ප්‍රවේශයේ ලක්ෂණවලට අදාළ කාණ්ඩය,
A - සංසන්දනාත්මක ස්වරූපයකින් යුක්ත වේ.
B - රටක දේශපාලන ස්ථාවරත්වයට තුඩුදුන් වඩාත් හොඳම ආණ්ඩුක්‍රමය කුමක්දැයි තෝරා ගනී.
C - තුලනාත්මක අධ්‍යනයේ ප්‍රවේශ දෙකකි.
D - තම රටේ දේශපාලනය පිළිබඳව මානව අවබෝධය කර ගත හැකිය.
E - එක් එක් රටවල දේශපාලන ඉතිහාසය දේශපාලන පසුබිම පිළිබඳව අවබෝධ කරගත හැකිය.
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

11. දේශපාලන විද්‍යාව අධ්‍යනයට අදාළ ආණ්ඩු කාණ්ඩ වන්නේ,
A ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
B ඒකීයවාදී ආණ්ඩු
C ධනවාදී ආණ්ඩු
D ප්‍රාදේශීය ආණ්ඩු
E සමාජවාදී ආණ්ඩු
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

12. රටක ව්‍යවස්ථාදායක කාර්යයන් පමණක් අඩංගු පිළිතුරු කාණ්ඩය වන්නේ,
A නීති සම්පාදනය කිරීම
B නීතිය හා සාමය ආරක්ෂා කිරීම
C ආධුනික මන්ත්‍රීවරු පුහුණු කරයි
D මුදල් සම්මත කරයි
E නව නීති සම්පාදනය කරයි
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

13. රාජ්‍ය හා ආණ්ඩුව සංවිධානය වී තිබෙන ආකාරය අනුව ප්‍රධාන තේමා 4කි. එයට අයත් කාණ්ඩය තෝරන්න.
A ව්‍යවස්ථාදායක ආයතන
B පළාත් සභාව
C විධායක ආයතන
D අධිකරණ ආයතන
E ආරක්ෂක නීතිය හා සාමය පිළිබඳ ආයතන
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

14. දේශපාලන පක්ෂ වලට අදාළ කාණ්ඩය,
A දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය අංගයකි.
B පක්ෂ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි.
C පක්ෂ රටින් රටට වෙනස් නොවේ.
D 19 වන සියවස මැද පටන් යුරෝපයේ බිහිවීම සිදු විය
E ජනතාව දැනුවත් කිරීම කරයි.
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

15. ලිබරල්වාදී රාජ්‍යයක ලක්ෂණ වලට අදාළ කාණ්ඩය තෝරන්න.
A නිදහස් මැතිවරණ
B දේශපාලන පක්ෂ
C යහපාලනය
D ස්වාධීණ අධිකරණ
E රණපරමවාදය
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABDE (5) ABCE ( )

- ප්‍රශ්න අංක 16 සිට 25 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරින් එකක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

16. රාජ්‍යය:
(1) විශේෂිත දේශපාලන ව්‍යුහයන්ගෙන් සමන්විත දේශපාන සංවිධානයක් වේ.
(2) සෑම සමාජ විද්‍යාවකම පදනම් සංකල්පය වේ.
(3) පොදු ආශාවන් යන ආවරණය යටතේ අනෙක් සෑම සමාජ සංවිධානයකටම ඉහළින් සිටින උත්තරීත්ර දේශපාලන සංවිධානය වේ.
(4) ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාකාරිකයා වේ.
(5) ප්‍රභවය සහ ස්වභාවය විවිධ දේශපාලන ගුරුකුල විසින් විවිධාකාරයට දක ඇත. ( )

17. ස්වාධිපති බලය:
(1) රාජ්‍යයට පමණක් හිමිකම් කිවහැකි උත්තරීතර බලය වේ.
(2) අසහාය මෙන්ම අසීමිත බලයක් ලෙස සැලකේ.
(3) මිනිස් සමාජයක් රාජ්‍ය ලෙස සැලකීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු මූලිකාංගය වේ.
(4) 1648 වෙස්ෆෝලියා සාම සමථය විසින් රාජ්‍යයන්ට පවරන ලද බලය වේ.
(5) රාජ්‍ය වීම නිසාම රාජ්‍යයට හිමිවන සුවිශේෂී බලය වේ. ( )

18. ආණ්ඩුව:
(1) රාජ්‍යයේ පොදු ආශාවන් ක්‍රියාවට පරිවර්තනය කරන රාජ්‍ය හස්තය වේ.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය, හා අධිකරණය යනුවෙන් හැඳින්වෙන අංශ තුනෙන් සමන්විත වේ.
(3) රාජ්‍ය බලය ක්‍රියාවට නංවන පුද්ගල කණ්ඩායම වේ.
(4) එහි කාර්ය වෙනුවෙන් ජනතාවට වගකීමට බැඳී සිටින බව පොදුවේ පිළිගනී.
(5) වෙනස්කළ නොහැකි ස්ථාවර දෙයක් වේ. ( )

19. ව්‍යවස්ථාදායකයා:
(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය අංගයක් වේ.
(2) ඒකමාණ්ඩලික හෝ ද්විමාණ්ඩලික පදනම මත සංවිධානය වී ඇත.
(3) ආණ්ඩුවට සුජාතභාවය සපයන ප්‍රධාන ආණ්ඩුක්‍රම ආයතනය වේ.
(4) දේශපාලන පක්ෂ විසින් තෝරා පත්කරන සමාජිකයින්ගෙන් පමණක් සමන්විත වේ.
(5) තත්ත්වයෙන් හා වරප්‍රසාද වලින් ඒක හා සමාන සාමාජිකයින්ගෙන් යුක්ත වේ. ( )

20. විධායකයා:
(1) ආණ්ඩු යාන්ත්‍රණය මෙහෙය වන ප්‍රධාන ධාවකයා වේ.
(2) රාජ්‍යයේ ප්‍රධානියාගෙන් සහ අමාත්‍යවරුන්ගෙන් සමන්විත වේ.
(3) ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමීඩයේ ඉහළම තිලය වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදය යටතේ සංවිධානය කරන්නේ ජනාධිපති, අර්ධ ජනාධිපති සහ කැබිනට් වශයෙනි.
(5) රාජ්‍යයේ උත්තරීතර නීති සම්පාදනය කරන ආණ්ඩුවේ බලධාරී අංශය වේ. ( )

21. අධිකරණය:
(1) රාජ්‍යයේ නීති ක්‍රියාවට නැංවීම සඳහා ආණ්ඩුව විසින් යොදා ගැනෙන උපකරණය වේ.
(2) දේශපාලන ක්‍රමයක පවතින උසාවි පද්ධතිය වේ.
(3) රාජ්‍ය නීති අර්ථකථනය කරන ආයතනය වේ.
(4) සාමාන්‍යයෙන් ඉහළ උසාවි හා පහළ උසාවි වශයෙන් මට්ටම් දෙකක් අනුව සංවිධානය කෙරේ.
(5) පුද්ගල අයිතිවාසිකම්වල භාරකරුවා සහ ආරක්ෂකයා ලෙස සැලකේ. ( )

22. නීතිය:
(1) රාජ්‍ය විසින් එහි සාමාජිකයින්ගේ හැසිරීම පිළිබඳ ව දක්වන සාමාන්‍ය නියම වේ.
(2) යම් පිළිවෙතකට අනුව සෑම විට ම ලේඛන ගත කිරීම සහ වාර්තාගත කිරීම කරනු ලැබේ.
(3) සිවිල් සමාජයේ කැමැත්ත සහ අනුමැතිය සහිත ව රාජ්‍ය විසින් බලාත්මක කරනු ලැබේ.
(4) සුවිශේෂී අවස්ථාවන්හි දී හැරුන විට සියලු දෙනාට ම සමානව යෙදවේ.
(5) කඩකළ විට දඬුවමට යටත් වේ. ( )

23. නිදහස් සහ සාධාරණ මැතිවරණයක මූලික ලක්ෂණ වන්නේ,
(1) කාලීනව පැවැත්වීම
(2) තාර්කිකව තීරණ ගැනීම සඳහා ඡන්දදායකයාට පූර්ණ නිදහස තිබීම
(3) සුදුසුකම් සහිත ඕනෑම අයෙකුට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් විය හැකි වීම.
(4) නුසුදුසුකම් නොසලකමින් සෑම අයකුටම ඡන්ද බලය ලබා දීම.
(5) සෑම ඡන්දයක් ම ගණනය කිරීම සහ ප්‍රතිඵල විවෘතව සහ නිවැරදිව දැක්වීම ( )

24. දේශපාලන පක්ෂ:
(1) බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වේ.
(2) සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.
(3) ජනතා සහ කේඩර ලෙස වර්ගීකරණය කරනු ලැබේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය නොවේ.
(5) දේශපාලන සමාජානුයෝජන ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ. ( )

25. බලපෑම් කණ්ඩායම්:
(1) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ වැදගත් ක්‍රියාකාරිකයින් වේ.
(2) ආණ්ඩුවට තොරතුරු සපයන වැදගත් මූලාශ්‍ර වේ.
(3) පෞද්ගලික අරමුණු ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන ගොඩනගා තිබේ.
(4) ආශා කණ්ඩායම් ලෙස ද හැඳින් වේ.
(5) බහුල ලෙස සංවිධානය කර ඇත්තේ නාගරික කම්කරුවන් විසිනි. ( )

● අංක 26 සිට 35 දක්වා ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ පහ අතුරින් ඒ ඒ මාතෘකාවට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

26. 1833 දී හඳුන්වා දුන් කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවල ඇතැම් දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක:
A නිදහස් ශ්‍රම වෙළඳපොළ බිහිවීම
B ඒකීය පරිපාලන ක්‍රමයක් සහ නීති ක්‍රමයක් වර්ධනය වීම
C ධනවාදී ආර්ථික ක්‍රමයේ නැගී ඒම
D ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ආරම්භ වීම
E කුල වෙනස්කම උග්‍ර වීම
(1) ABCD (2) BCDE (3) ABCE
(4) ABDE (5) ACDE ( )

27. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ සමහර අහිතකර දේශපාලන හා සමාජ ආර්ථික ප්‍රතිවිපාක:
(1) ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකයේ බිඳ වැටීම
(2) දේශීය මධ්‍යම පන්තියක් බිහි වීම

4181

C වාණිජ වතු වගාව හඳුන්වා දීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ඉඩම් ප්‍රශ්නය ඉස්මතු වීම
D ඉංග්‍රීසි භාෂාව උගත් සහ නූගත් වශයෙන් සමාජය නව රේඛාවකින් බෙදී යාම
E නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනයේ අසමතුලිතභාවය අවම වීම
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ABDE (5) ABCE ( )

28. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා:
A බ්‍රිතාන්‍ය කිරීටයේ සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයා විය.
B අමාත්‍ය මණ්ඩලයේ නායකයා විය
C ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන විධායකය විය
D යටත් විජිතය තුළ අධිරාජ්‍යයේ ආශාවන් ආරක්ෂා කිරීමේ ප්‍රධානියා විය.
E සෑම පනතකටම අවසාන අනුමැතිය දීමේ බල අධිකාරිය ඉසිලීය.
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ABDE (5) ABCE ( )

29. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ:
(1) අග්‍රාණ්ඩුකාරයා සහ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විධායක ආණ්ඩුව
(2) අග්‍රාණ්ඩුකාරවරයා ද, සෙනට් මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලය යන නම්වලින් හැඳින්වුණු ද්විත්ව මණ්ඩලයෙන් ද සමන්විත ව්‍යවස්ථාදායකය
(3) අග්‍රාණ්ඩුකාරවරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වීම
(4) ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වා ගෙනයාම සහතික කිරීම උදෙසා ස්ථාපිත කළ රාජ්‍ය සේවා කොමිසම
(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වයෙන් යුත් ස්වාධීන අධිකරණය
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

30. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය:
(1) කැබිනට් අමාත්‍ය මණ්ඩලය ලෙස හැඳින්වින
(2) අග්‍රාණ්ඩුකාරවරයා විසින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් පත් කෙරිණ
(3) අගමැති නමින් හැඳින්වුන ඇමතිවරයකුගේ නායකත්වය යටතේ පැවතියේය.
(4) පාර්ලිමේන්තුවට සාමූහිකව වගකිව යුතු විය.
(5) ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ හැකි විය.
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

31. සුළුතර ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සෝල්බරි ව්‍යවස්ථාවෙන් සැපයූ විශේෂ ආවරණ
A - මූලික අයිතිවාසිකම් පිළිබඳ විශේෂ පරිච්ඡේදය
B - ව්‍යවස්ථාවේ 29 (2) වගන්තිය
C - සෙනෙට් සභාව
D - බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස සහ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් සය දෙනකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම
E - ස්වාධීන අධිකරණය සහ ස්වාධීන රාජ්‍ය සේවාව
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

32. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මූලිකාංග වන්නේ,
(1) බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය සහිත ආණ්ඩුක්‍රමය
(2) අගමැති සහ කැබිනට් මණ්ඩලය සත්‍ය විධායකය වූ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
(3) නීති සම්පාදනයේ ලා පූර්ණ බලය සහිත ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය
(4) බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල්තැන ගත් අධිකරණ ක්‍රමය
(5) අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය උදෙසා පත්කළ කොමිෂන් සභා ද්විත්වය
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

33. ශ්‍රී ලංකාව තුළ ජාතික ව්‍යාපාරය පැන නැගීම කෙරෙහි බලපෑ සාධක වන්නේ,
(1) බටහිර අධ්‍යාපනය ලද මධ්‍යම පන්තියේ නැගී ඒම
(2) ආගමික පුනර්ජීවන ව්‍යාපාරය
(3) 1911 දී ආරම්භ වූ අමද්‍යප ව්‍යාපාරය
(4) භාෂා ප්‍රශ්නය මත වාර්ගික කණ්ඩායම් අතර ඇතිවන බෙදීම්
(5) වගකිව යුතු ආණ්ඩුවක් ලබා ගැනීමේ අවශ්‍යතාවය
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

34. ලංකාවේ ජාතික ව්‍යාපාරය:

A - පුළුල් ජනතා ව්‍යාපාරයක් විය
B - ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් විය
C - ඉන්දියානු ජාතික ව්‍යාපාරය මෙන් බලවත් එකක් නොවීය
D - බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් මෙහෙය වූ ව්‍යාපාරයක් විය
E - ලාංකිකයින්ට වඩාත් වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ලබා ගැනීම උදෙසා මෙහෙය වූ ව්‍යාපාරයක් විය

((1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

35. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A බ්‍රිතාන්‍ය පාලකයින් විසින් නිදහස සමග ප්‍රදානය කළ නිදහස් ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව විය
B සමාන බලැති මණ්ඩල දෙකක් සහිත ව්‍යවස්ථාදායක සභාවක් සැපයුවේ ය.
C 1944 ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල කෙටුම්පත මත මූලික වශයෙන් පදනම් විය
D සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළේය.
E 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමක් සමග අහෝසි විය

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

අංක 36 සිට 44 දක්වා අදාළ ප්‍රකාශය තෝරන්න.

36. දේශපාලනය කිරීම යන්නෙන් අදහස් කරන්නේ,
(1) ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීම
(2) ඡන්දදායකයින්ගේ චර්යාව
(3) ආණ්ඩුවේ ප්‍රතිපත්ති
(4) වෘත්තීය දේශපාලනඥයන්ගේ චර්යාව
(5) යුද්ධය හා සාමය ( )

37. දේශපාලනය හැදෑරීම යන්නෙන් අදහස් කරන්නේ,
(1) ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි
(2) ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීම
(3) මැතිවරණ වලට සහභාගි වීම
(4) දේශපාලන පක්ෂ වල ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීම
(5) සටන් හා විරෝධතා ව්‍යාපාර ආදියට සහභාගි වීම ( )

38. ස්ත්‍රීවාදී ප්‍රවේශය ශාස්ත්‍රීය ධාරාවක් බවට පත් වූයේ කුමන දශකයේ දී ද?
(1) 1950 දශකයේ දීය. (2) 1960 දශකයේ දීය (3) 1970 දශකයේ දීය
(4) 1940 දශකයේ දීය (5) 1930 දශකයේදී ය. ( )

39. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක් වන්නේ
(1) රුසියාව (2) චීනය (3) කියුබාව
(4) උතුරු කොරියාව (5) මහා බ්‍රිතාන්‍ය ( )

40. සමාජවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ
(1) රණපරමවාදය (2) ඒක පක්ෂ ක්‍රමය (3) බුද්ධි විරෝධීභාවය
(4) ජාතිවාදය ඇවිස්සීම (5) බලකාමය

41. දේශපාලනය හදාරන විධිමත් ආයතනයක් වන්නේ,
(1) පෞද්ගලික පන්ති (2) පන්සල (3) පාසල
(4) කාර්මික විද්‍යාල (5) මුහුණු පොත ( )

42. බලපෑම් කණ්ඩායම්
(1) පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානය කරනු ලබයි
(2) ඒකාධිකාරී දේශපාලන ක්‍රම තුළ ද ක්‍රියාත්මක වීමේ පූර්ණ නිදහස භුක්ති විඳී
(3) සාවද්‍ය සහ පදනම් විරහිත තොරතුරු සැපයීම මගින් ආණ්ඩු නොමග යවයි
(4) ප්‍රජාතන්ත්‍රවාදයෙ සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස නොසැලකේ.
(5) රහසිගත සංවිධාන මාර්ගයක් වේ ( )

43. අන්තර්ජාතික දේශපාලනය
(1) නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනයයි
(2) කුඩා බලවතුන් අතර කෙරෙන්නා වූ දේශපාලයයි
(3) මහා බලවතුන් අතර කෙරෙන්නා වූ දේශපාලනයයි
(4) රාජ්‍ය නොවන සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනයයි
(5) සිවිල් සමාජ අතර කෙරෙන්නා වූ දේශපාලනයයි ( )

44. ලෝකයේ බිහි වී ඇති ඒකීය රාජ්‍යයක් වන්නේ
(1) ස්විට්සර්ලන්තය (2) ඇමරිකා එක්සත් ජනපදය (3) ප්‍රංශය
(4) කැනඩාව (5) දකුණු අප්‍රිකාව ( )

අංක 45 සිට 50 දක්වා ප්‍රකාශ පහෙන් හතරක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

45. සමාජවාදී රාජ්‍ය මාදිලිය සම්බන්ධයෙන් අදාළ වන්නේ
A කාල් මාක්ස්ගේ දාර්ශනික චින්තනය මත පදනම් විය
B ධනවාදී හා ලිබරල්වාදී රාජ්‍ය මාදිලියට විකල්පයක් ලෙස ගොඩනැගින
C පෞද්ගලික ව්‍යවසාය වෙනුවට රාජ්‍ය ආධිපත්‍ය ස්ථාපනය වේ
D පන්ති සහිත සමාජයක රාජ්‍ය මර්දනකාරී ආයුධයක් බවට පත්වේ
E එය බහු දේශපාලන පක්ෂ ක්‍රමයකින් යුක්ත වෙයි
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

46. ෆැසිස්ට්වාදී රාජ්‍ය මාදිලිය සම්බන්ධයෙන් අදාළ වන්නේ
A 1920 හා 1930 දශකවල ඉතාලිය හා ජර්මනිය මුල්කර ගෙන නිර්මාණය විය
B රාජ්‍ය හා ජාතිය සර්වසම තත්ත්වයට පත් කරයි
C රාජ්‍ය බලය අසීමිත වූවකි
D රාජ්‍යයට ආරම්භයක් මෙන්ම අවසානයක් ඇති බව පෙන්වා දෙයි
E සන්නද්ධ බලය මෙම රාජ්‍ය ක්‍රමයේ පදනම වේ
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

47. පුරවැසියා රාජ්‍යයට අවනත වීමට අදාළ හේතූන් වන්නේ,
A රාජ්‍යයේ අවසාන අරමුණ සියලු පුරවැසියන්ගේ සුභසාධනය සලසාදීම නිසාය
B රාජ්‍ය පුරවැසියාට ආරක්ෂාව ලබාදෙන නිසාය
C රාජ්‍ය සමාජයට ආරක්ෂාව සපයන නිසාය
D රාජ්‍ය මිලිටරි බලය පුරවැසියා වෙත යොමු කරන නිසාය
E පුරවැසියාගේ ස්වාභාවික අයිතිවාසිකම් රාජ්‍ය විසින් ආරක්ෂාකර දෙන නිසාය
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

48. "ස්ත්‍රී වාදය" සම්බන්ධයෙන් අදාළ වන්නේ
A පුරුෂ කේන්ද්‍රිය ආධිපත්‍යයෙන් මිදීම මූලික අරමුණයි
B රාජ්‍ය පුරුෂ මූලික මෙවලමක් බව ප්‍රකාශ කරයි
C ස්ත්‍රීවාදය විවිධ ගුරුකුල වලින් යුක්ත වෙයි
D රාජ්‍ය සම්බන්ධව ස්ත්‍රීවාදයට න්‍යායක් නොමැත
E රාජ්‍ය මැදිහත්වීමකින් තොරවම ස්ත්‍රී විමුක්තිය ආරක්ෂා කරයි
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

49. ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ වලට අදාළ වන්නේ
A රාජ්‍යයේ ස්වාධිපත්‍ය මධ්‍යයට හා පරිධියට වෙන් කර ඇත
B කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයක් ගෙන යාමට මග පාදයි
C මධ්‍යයේ ව්‍යවස්ථාදායකය උත්තරීතර වේ
D මධ්‍යම ආණ්ඩුවට පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමට බලය ඇත
E පරිපාලන පහසුව සඳහා ප්‍රාදේශීය ආයතයන්ට බලය විමධ්‍යගත කර ඇත.
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )

50. සන්ධීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයන්ට අදාළ වන්නේ
A මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් බෙදෙයි
B මධ්‍යයේ හා පරිධියේ බලතල ස්වාධීන වේ
C මෙවැනි ආණ්ඩු ක්‍රමයක් අනිවාර්යයෙන්ම නම්‍ය හා අලිඛිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකින් යුක්ත වේ
D ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරේ.
E මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වාදය මත පදනම් වේ
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE ( )